**ජාතික අධ්‍යාපන ආයතනය - 2015**

**----------------------------------------**

ජාතික අධ්‍යාපන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තුමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හා මුදල් සමාන දෑ ගණනය කිරීමේදී අතැති මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් වලින් යුත් ආයෝජන සැලකිල්ලට ගත යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී රු. 321,948,287 ක කෙටිකාලීන තැන්පතු මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් සලකා ගණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභාලාභ අපහරණ ලාභ අරමුදල නම් අරමුදලක් හරහා ගැලපිම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය වන විට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---

ආයතනයට හිමිකමක් නොමැති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘතියකට අයත් රු. 4,000,000 ක් වටිනා වාහන 02 ක් ආයතනයේ වත්කම් ලෙස 2014 වර්ෂයේ සිට ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 213,909 ක ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. එය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---

2016 ජනවාරි 14 වන දින සංයුක්ත තැටි පිළිබඳව සිදු කරන ලද භෞතික නියැදි පරීක්ෂාවේදී තොග ගබඩාව තුල විෂයයන් 44 කට අදාල රු.1,252,600 ක් වටිනා සංයුක්ත තැටි 6263 ක ප්‍රමාණයක් පැවති අතර එම ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ තොග ලේඛනවල ශේෂය සමඟ සැසඳීමේදී රු. 412,000 ක් වටිනා සංයුක්ත තැටි 2060 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසැල් පදනම් කරගත් ඇගැයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800 ක මුදලක් 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) එකතුව රු. 3,306,017 ක් වූ ගෙවිය යුතු වියදම් තුල වර්ෂ 2 සිට වර්ෂ 5 අතර එකතුව රු.1,397,421 ක් හා වර්ෂ 05 ඉක්මවූ රු. 391,613 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සදහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සන්නිවේදන පහසුකම් ලබන නිලධාරීන්ට හිමි උපරිම දුරකථන සීමාවන්ට අදාල රාජ්‍ය මුදල් චක්‍රලේඛය වැරදි ලෙස අර්ථකථනය කරමින්, ආයතනය විසින් 2015 ජුලි 02 දින අංක 452 (1) දරන අභ්‍යන්තර පාලන චක්‍රලේඛයක් නිකුත්කර අදාල නිලධාරීන්ට රු.91,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.7 හා 9.8 ඡේද | කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ දර්ශන ශූරී පාඨමාලාව හදාරන නිලධාරීන් 6 දෙනා සඳහා 2014 නොවැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා එක් අයෙකුට මාසික දීමනාව ඇ.ඩො. 150 බැගින් එකතුව රු. 1,663,200 ක් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1 (ආ) වගන්තිය | වටිනාකම රු.500,000 ක් ඉක්මවන ප්‍රසම්පාදන වෙනුවෙන් ගිවිසුම් අත්සන් කළ යුතු වුවත් එසේ සිදුනොකර අවස්ථා 12 කදී එකතුව රු.29,788,288 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 9.3.1 (ආ) ඡේදය | මෝටර් වාහන හා උපකරණ අලුත්වැඩියා කිරීමේදී රු.200,000 කට වඩා වැඩි වියදම් සඳහා අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 3 කදී දරන ලද එකතුව රු.870,106 ක අලුත්වැඩියා වියදම් සම්බන්ධයෙන් එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 157,631,150 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 59,870,748 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 97,760,402 ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2015 වර්ෂයේදී ආයතනයේ වියදම් රු. 51,914,694 කින් වැඩි වී තිබුණද ආදායම රු. 149,675,095 කින් වැඩිවීම නිසා ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වී තිබුණි.

### 3.2 දායකත්වය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මූල්‍ය අතිරික්තය සියයට 64 කින් අඩුවී තිබුණද දායකත්වය අඩුවීම සියයට 7 ක් පමණි. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබූ අතර සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු ආයතනයේ සමස්ථ දායකත්වය 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පිළිවෙලින් රු.318,104,459 කින් රු.336,995,276 කින් හා රු.500,421,340 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය වනවිට දායකත්වය සියයට 57 කින් ඉහල ගොස් තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 5.4:1 ක් හා 3.3:1 ක් විය. එසේම ක්ෂණික අනුපාතය 5.2:1 ක් හා 2.8:1 ක් විය. ජංගම වත්කම් තුල සියයට 86 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැදුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි. ආයතනය සතුව ඇති බැංකු ගිණුම් 6 න් 2 ක 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 96 ක් හා රු. මිලියන 88 ක ශේෂයක් තිබූ අතර, අවශ්‍යතා ඉක්මවා මුදල් ශේෂ පවත්වා ගැනීමත් කෙටිකාලීන ආයෝජන සිදුකිරීමත් හේතුවෙන් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත වැඩිවීමට හේතුවී තිබුණි.

### 3.4 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ නිළධාරීන් 06 දෙනෙකු විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් එකතුව රු. 11,651,636 ක් වන්දි ඉල්ලා ආයතනය විසින් අධිකරණ වල නඩු 06 ක් ගොනුකර තිබුණු අතර ඉන් එක් නඩු තීන්දුවක් ප්‍රකාරව වාරිකය රු.14,604 බැගින් රු.876,236 ක් වාරික 60 කින් ගෙවා අවසන් කිරීමට තීරණය කර තිබුණි.

(ආ) නිලධාරීන් හතර දෙනෙකු මූල්‍ය වංචාවක් මත සේවයෙන් පහ කිරීම සහ ගුරු පුහුණු සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් නඩු 4 ක් පවරා තිබුණි. ඉන් නඩු දෙකකට අදාල නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,336,075 ක හිඟ වැටුප් ගෙවා ඔවුන් නැවත සේවයේ පිහිටුවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය හා ප්‍රවර්ධනය, විවිධ අධ්‍යාපන විෂයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය, අධ්‍යාපන පද්ධතියේ කාර්යසාධනය හා අධ්‍යාපන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම, අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම හා අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ වෘත්තීය නිපුණත්වය වැඩිකිරීම ආදී අරමුණු පෙරදැරි කරගත් ජාතික අධ්‍යාපන ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළමු වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් පළාත් සම්පත් දායක කණ්ඩායම් මගින් සම්පත් දායකයන් 600 ක් පුහුණු කිරීම ඉලක්කය වුවත් වැඩසටහන් 08 ක් මගින් සම්පත් දායකයන් 477 ක් පමණක් පුහුණු කර තිබුණි.

(ආ) පූර්ව ළමාවිය සංවර්ධන පිරිවිතරයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම (වයස අවුරුදු 7), දත්ත වාර්තා විශ්ලේෂණය කිරීම හා එහි ප්‍රතිඵල දැනුම්දීම සිදුකළ යුතු වුවද දත්ත විශ්ලේෂණය පමණක් සිදු කර තිබුණි.

(ඇ) දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ඩිප්ලෝමාව. 2014/2015 කණ්ඩායමේ මාතෘකා 05 ක් යටතේ පර්යේෂණ යෝජනා අනුමත කිරීම සිදුකර නොතිබුණු අතර 2015/2016 කණ්ඩායමේ ව්‍යාපෘති 16 ක් ඇගයීම් කිරීම කළ යුතු වුවද එය සිදුකර නොතිබුණි.

(ඈ) අධ්‍යාපන පර්යේෂණ ජර්නල් 03 ක් ප්‍රකාශයට පත් කිරීම සිදුකල යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සතු වාහනය හා යුනිසෙෆ් ආයතනය මගින් ආයතනය වෙත පරිත්‍යාග කරන ලද වාහනය ආයතනය වෙත පවරා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වැටුප් සහිත වර්ෂ 02 ක් සහ වැටුප් රහිත වර්ෂයක් ඇතුළුව වර්ෂ 03 ක කාලයකට නිලධාරීන් 04 දෙනෙකු හා කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා නිලධාරීන් 06 දෙනෙකු ඇතුළුව නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.24,593,922 ක් ගෙවා තිබුණි. කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යාපනය හදාරන නිලධාරීන් ආයතනයට දින කිහිපයක් සේවයට වාර්තා කර ඇති අතර කොළඹ ඉගෙනුම් මධ්‍යස්ථානයේ පැමිණීමේ වාර්තා අනුව ඔවුන් 2015 ජනවාරි සිට මාර්තු දක්වා පාඨමාලාවට සහභාගි වී නොතිබුණි. එහෙත් මෙම නිලධාරීන් 10 දෙනා අදාල අධ්‍යයන කටයුතුවලට සහභාගි වී හෝ නිසි පරිදි රාජකාරියට වාර්තා කිරීමෙන් තොරව 2014 නොවැම්බර් සිට 2015 මාර්තු මාසය දක්වා රු.2,818,890 ක වැටුප් ලබාගෙන තිබුණි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) හා ශ්‍රී ලංකා රජය 2012 සැප්තැම්බර් මාසයේ එළඹි ගිවිසුමට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය ක්‍රියා කළයුතු ආයතන වන අතර ගිවිසුමේ 8 වගන්තිය අනුව යුනෙස්කෝ ආයතනය විසින් එක් එක් ක්ෂේත්‍රවල විශේෂ වූ දැනුම ඇතුළු තාක්ෂණ සහාය ලබාදීම සිදුකිරීමට එකඟ වී තිබුණද 15 වන වගන්තිය අනුව ගිවිසුමේ කාලය වර්ෂ 06 ක් වන අතර දැනට වර්ෂ 3 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ දකුණු ආසියානු

ගුරු පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර යුනෙස්කෝ තාක්ෂණ සහායද ලබාගෙන නොතිබුණි.

(ඈ) 2001 අගෝස්තු 13 දිනැති අංක 2/ඉඩම/බප01/1416/97 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් පවරා දුන් රු.78,600,000 ක් වටිනා හෙක්ටයාර් 7.0958 ක් වූ ඉඩම හා රු.65,000,000 ක් වටිනා බඳුවත්ත ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමකින් තොරව ආයතනය සතු වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඉ) 2008 වර්ෂයේදී ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් රු. 27,848,100 ක ඇස්තමේන්තු සකස්කර තිබූ අතර සැලසුම් හා ඇස්තමේන්තු සකස්කිරීම සඳහා 2008 මාර්තු 14 දින උපදේශක සමාගමක් සමඟ ගිවිසුම්ගතව, උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් එනම් රු. 1,200,949 ක් ගෙවා වසර 8 ක් ගතවී තිබියදීත් ඉදිකිරීම් කටයුතු 2016 ජුනි 30 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සැකසීම සඳහා රාජ්‍ය ආයතනයක් නොවන තනි පුද්ගලයෙකු සමඟ ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව 2013 ජූනි 25 සිට වසර 2 ක කාලයකදී සංවර්ධන කටයුතු අවසන් කිරීමට ගිවිසුම්ගතව 2013 ජූලි මාසයේදී රු. 140,000 ක් ගෙවා තිබුණද මෙම තොරතුරු පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සංවර්ධනය කර නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2011 වර්ෂයේදී රු. 8,750,000 ක් වෙන්කර තිබුණද 2015 මාර්තු 31 දින වන තෙක්ම මෙම අරමුදල ප්‍රයෝජනයට ගෙන කිසිදු පර්යේෂණ ක්‍රියාවක් සිදුකර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුරු නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.85,794,089 ක් වැයකර ඉදිකිරීම් නිමකර වසරක් ගතවීමට ආසන්නව ඇති ගුරුපුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භකර නොතිබූ අතර රු.4,814,318 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රයෝජනයට නොගෙන ඒවායේ වගකීම් කාලයද අවසන් වී තිබුණි.

(ආ) නිසි සැලැස්මක් අනුව පොත් මුද්‍රණ කටයුතු නොකිරීම හේතුවෙන් විෂයයන් 90 කට අදාලව රු. 5,069,146 ක වටිනාකමක් ඇති පොත් 48,160 ක් දීර්ඝ කාලයක් තිස්සේ අලෙවි නොවී විගණන දිනය වූ 2016 ජුනි 30 දක්වා ගබඩාව තුල පැවති බව නිරීක්ෂණය විය.

## 4.6 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ඉදිකිරීම් පිරිවැය රු.93,975,432 ක්වූ දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2015 මාර්තු 17 දින ආයතනයට භාරදී තිබුණද විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී විවිධ ස්ථානවල බිත්ති පුපුරා තිබීම, ජනෙල්, දොරවල් හා ටයිල් ගැලවී තිබීම, කොන්ක්‍රීට් කණු පුපුරා තිබීම, ගොඩනැගිල්ල තුලට වතුර කාන්දුවීම ආදී විශාල අඩුපාඩු රාශියක් නිරීක්ෂණය වූ අතර මෙහිදී ඉදිකිරීම් වල ශක්තිමත්භාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 22 දිනැති අංක DMS/B1/37/3/Vol 111 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය පරිදි අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 455 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 197 ක් පුරප්පාඩු වී තිබුණි. එම පුරප්පාඩු තුළ ආයතනයේ ඉහළ කළමනාකරණයට අයත් තනතුරු සංඛ්‍යාව 119 ක් වූ අතර ඉන් 100 ක් කථිකාචාර්යවරුන් වීම හා වැඩ ආවරණ තනතුරු 13 ක් වීම හේතුවෙන් දැයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා වන කාර්යභාරයේදී විෂය මාලා සංවර්ධනය ඇතුළු ආයතනයට පැවරී ඇති වගකීම් නිසි ලෙස ඉටුකිරීමට ඇති හැකියාව ගැටළු සහිත බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පුරප්පාඩු 95 ක් පිරවීම සඳහා අවස්ථා 3 කදී රු.267,731 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පලකර තිබුණද එම එකදු පුරප්පාඩුවක් හෝ සමාලෝචිත වර්ෂයේදී පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතනයේ සංවිධාන සටහන අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් තනතුරු 5 කින් සමන්විත වුවද ඉන් තනතුරු 3 ක්ම පුරප්පාඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදීද එම තනතුරු පිරවීමට කටයුතු කිරීමකින් තොරව ද්විතියන හා අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂකවරු 5 දෙනෙකු පත් කර රු.154,120 ක දීමනා ගෙවා තිබුණු අතර දෙපාර්තමේන්තු අටක ප්‍රධානීන් 8 දෙනෙකු සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.

(ඉ) සහකාර කථිකාචාර්ය තනතුරු 2 ක් සඳහා 2011 ජූනි 01 දින හා 2013 දෙසැම්බර් 01 දින අනියම් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. 3,181,505 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව අධ්‍යක්ෂක (මුද්‍රණ) තනතුරක වැඩ බැලීම සඳහා මාසිකව රු.9,632 ක වැඩ බැලීමේ වැටුපක් ගෙවීමේ පදනම මත 2015 ඔක්තෝබර් 29 දින සිට නිලධාරියෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**--------------------------------------**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

**------------------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 24 සිට සියයට 1647 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

**-------------------------------**

2009 ජූනි 01 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ (I) හා (II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු. 1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු. 156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් වැඩ බැලීමේ වැටුප් ගෙවීම. |
| (ආ) | විදේශ හා දේශීය පුහුණුවීම් | විධිමත් ආකාරයට නිලධාරීන් තෝරා නොගැනීම හා අනුමැතියකින් තොරව දීමනා ගෙවීම. |
| (ඇ) | වාහන පාලනය | වාහන පවරා නොගැනීම. |
| (ඈ) | කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | අදාල නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) | තොග පාලනය | යල් පැනගිය හා අක්‍රිය තොග සම්බන්ධ ක්‍රියාමාර්ග නොගැනීම හා පොත්පත් යාවත්කාලීන නොකිරීම. |
| (ඊ) | ස්ථාවර වත්කම් පාලනය | ආයතනයට අයත් ඉඩම්, වාහන නිසි පරිදි පවරා නොගැනීම හා ඌන උපයෝජිත වත්කම් ඵලදායී ලෙස යොදා නොගැනීම. |